මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date: 2023 - 01 - 09

පැමිණිලි පාර්ශවය : ඒ.එම්.ඉන්ද්‍රාණි කුමාරි අබේකෝන් මිය,
අංක. 126/1, ලයනල් අඟුනාවල මාවත,
කුරුඳුවත්ත පාර, අඟුණාවල
පේරාදෙණිය.

වගඋත්තර පාර්ශවය : ස්ථානාධිපති,
පොලිස්ථානය,
පේරාදෙණිය.

පැමිණිලි අංකය : HRC/K/267/21/A

**පැමිණිලි පාර්ශවයේ සැළකිරිම :-**

ඉහත නම් සඳහන් පැමිණිලි පාර්ශවය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, තමාට මහනුවර අතිරේක මහේස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්ගේ අත්සනින් යුතුව අංක 23078/19 දරණ නඩුවට 2020.10.07 දින පෙනී සිටින ලෙස සිතාසියක් ලැබුණු බවත්, තමාට එරෙහිව කිසිදු චෝදනාවක් නොමැති බැවින් මේ පිළිබඳව දැනගැනීමට තමාගේ සැමියාද සමඟ පේරාදෙණිය පොලිස්ථානයට ගොස් ස්ථානාධිපති මුණගැසී කරුණු විමසා සිටි බවත්, ඒ අවස්ථාවේදී ස්ථානාධිපති නුරුස්නා ආකාරයෙන් "තමාට පොලිස් නිලධාරියෙකු ලෙස ඕනෑම දෙයක් කළ හැකි බව" තර්ජනාත්මක ස්වරූපයෙන් ප්‍රකාශ කළ බවත්ය. තමාට අවශ්‍ය වූයේ සිතාසිය යොමු වූයේ කුමන චෝදනාවක් හේතුවෙන්ද බව දැනගැනීමට පමණක් බවත්, සිතාසිය අනුව අදාළ දින තමා අධිකරණයට ගිය නමුත් රටතුල පැවති කොරෝනා වසංගය හේතුවෙන් එදින අධිකරණ කටයුතු කල්දමා ඇති බව දැනගැනීමට හැකි වූ බවත්, නැවත 2021.05.21 දින එම නඩු අංකය යටතේම එම සිතාසියේ පී.ඩබ්.එම්.ශ්‍රියා පද්මලතා අඟුණාවල යන අයගේ නම ටිපෙක්ස් කර මකා දමා තමාගේ නම ඇතුළත් කර අපරාධ නඩු විධාන සංග්‍රහයේ 81 වගන්තිය ප්‍රකාරව' සාමය ආරක්ෂා නොකිරිම' යන චෝදනාව සහිතව 2021.07.07 දිනට එම අධිකරණයට පැමිණෙන ලෙස දන්වන ලද දැන්වීම ප්‍රකාරව තමා අධිකරණයට ගිය නමුත්



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

එදිනද අධිකරණ කටයුතු නොපැවැත්වූ බැවින් තමා ආපසු ආ බවත්, මේ දක්වාම තමාට එරෙහිව කිසිදු පොලිස්ථානයක කිසිවකු විසින් කිසිදු පැමිණිල්ලක් සිදුකර නොමැති බවත්, පේරාදෙණිය පොලිස් නිලධාරීන් විසින් මෙම සිතාසිය භාරදීමෙන් පසු වරින්වර තමාගේ නිවසට පැමිණීම හේතුවෙන් තමා හා පවුලේ අය දැඩි අපහසුතාවයට පත්ව සිටින බවත්, තමාට කිසිදු චෝදනාවක් නොමැතිව සිතාසියක් යොමු කිරීමෙන් තමාගේ අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බැවින් පරීක්ෂණයක් පවත්වා සාධාරණයක් ඉටුකර දෙන ලෙසත් ඉල්ලා ඇත.

**වගඋත්තර පාර්ශවයේ සැළකිරීම :-**

පැමිණිල්ලේ වගඋත්තර පාර්ශවය විසින් වාර්තාවක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, පේරාදෙණිය පොලිස් වසමේ කුරුඳුවත්ත අඟුනාවල ප්‍රදේශයේ පැමිණිලිකාරිය හා ඇගේ ස්වාමිපුරුෂයා ඇතුළු පවුලේ සහෝදර සහෝදරියන් 07 දෙනා පරම්පරාගත දේපලක් භුක්ති විඳිමින් ජීවත්වන බවත්, මෙම දේපල ඉඩකඩම් හේතුවෙන් 2009 වසරේ සිට සහෝදර සහෝදරියන් අතර ආරවුල් ඇති වී ඇති බවත්, පහරදීම්, බැන තර්ජනය කිරීම්, දේපල හානි, අපහාස වැනි චෝදනාවලට පැමිණිලි 50කට අධික ප්‍රමාණයක් තම ස්ථානයට ඉදිරිපත් කර ඇති බවත්ය.

මෙම පැමිණිලි සඳහා දෙපාර්ශව කැඳවා කිහිප අවස්ථාවකදීම අවවාද කර දෙපාර්ශවය සමථයට පත්කිරීමට උත්සහා කළ බවත්, සමථ නොවීම හේතුවෙන් සමථ මණ්ඩලයට ඉදිරිපත් කර ඇති බවත් අධිකරණයේ නඩු පැවරීම්ද සිදුකර ඇති බවත් සඳහන් කර ඇත.

පැමිණිලිකාරිය සහ අනෙක් පාර්ශවයන් තම ස්ථානයට ගෙන්වා මෙම පැමිණිලි විභාග කිරීමේදී දෙපාර්ශවයම තමා ඉදිරිපිට ද ඉතාමත් පහත් ආකාරයෙන් එකිනෙකා හට ගරහමින් විවේචනය කරමින් දැඩි වෛරයකින් හැසිරෙන ආකාරය තමා වෙත නිරීක්ෂණය වූ බවත්, මෙම පුද්ගලයින් කිසිවෙකුත් මෙම ආරවුල විසඳාගැනීමට ඉදිරිපත් වී නොමැති බවත්, එම හේතුව නිසාම දැඩි සාමය කඩකිරීම් හා ජීවිත දේපලවලට හානිකර ගනිමින් දිගින් දිගටම හැසිරීම හේතුවෙන් ඔවුන්ගේම ආරක්ෂාව සඳහා අපරාධ නඩු විධාන සංග්‍රහයේ 81 වගන්තිය යටතේ ගරු අධිකරණයට කරුණු වාර්තා කර අධිකරණය මගින් සියළුදෙනාට සාමයෙන් සිටින ලෙස නියෝග නිකුත් කිරීමට තමා විසින් කටයුතු කළ බවත් දක්වා ඇත.

පැමිණිලි විභාග කිරීමේදී මෙම අය කැඳවා ඔවුන්ගේ හැසිරීම් පාලනය කිරීමට තමා විසින් අවවාද කර සිටි බවත්, පැමිණිලිකාරිය එය වැරදි ආකාරයට තේරුම් ගෙන ඇති බවත්, පැමිණිලිකාරිය හට නිකුත් කර ඇති සිතාසියේ ටිපෙක්ස් කර ඇති බව සඳහන් කර ඇතත්, එය අධිකරණය මගින් නිකුත් කරන බැවින් එය අධිකරණයේ ප්‍රමාද දෝෂයක් බවත්, අධිකරණ කටයුතු තිබෙන අවස්ථාවලදී කැඳවීම් පිළිබඳව ඔවුන් දැනුවත් කිරීමට සිතාසි භාරදීමට පොලිස් නිලධාරීන් ඔවුන්ගේ නිවසට යැවීම සිදුකරන බවත්, එය කිසිවෙකු අපහසුතාවයට පත්කිරීමක් නොවන

බවත්, තමා විසින් අපරාධ නඩු විධින සංග්‍රහයේ 81 වගන්තිය යටතේ අධිකරණයට කරුණු වාර්තා කිරීමෙන් පසු දැඩි සාමය කඩවීමක් පිළිබඳ මෙතෙක් වාර්තා වී නොමැති බවත් එයින් එහි වටිනාකම පිළඹිබු වන බවත්ය.

**පරික්ෂණ හා විමර්ශන කටයුතු වලින් අනාවරණය වන කරුණු :-**

පැමිණිල්ලට අදාළව වගඋත්තර පාර්ශවීය පේරාදෙණිය පොලිස්ථානාධිපති විසින් එවා ඇති වාර්තාවේ සඳහන් වන්නේ, පැමිණිලිකාරියගේ සැමියා වන හරිචන්ද්‍ර අගුණාවල යන අය හා ඔහුගේ පවුලේ සාමාජිකයින් අතර පවතින ඉඩම් ආරවුල් සම්බන්ධයෙන් 2009 වර්ෂයේ සිට පොලිස්ථානය වෙත පැමිණිලි රාශියක් ලැබී ඇති බවත්, අදාළ පැමිණිලි සම්බන්ධයෙන් දෙපාර්ශවය කැඳවා විභාග කර සාමයෙන් සිටින ලෙසට අවවාද කර ඇති නමුත් දිගින් දිගටම ආරවුල් ඇති වන බැවින් බරපතල සාමය කඩවීම් වළක්වාගැනීම සඳහා අපරාධ නඩු විධාන සංග්‍රහයේ 81 වගන්තිය යටතේ නඩු පවරා ඇති බවයි.

පොලිසිය විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති වාර්තාව සමග ලබාදී ඇති පැමිණිලි 12ක පිටපත් අධ්‍යයනය කිරීමේදී පෙනී යන්නේ අදාල පැමිණිල්ලේ පැමිණිලිකාරියගේ ස්වාමියාගේ සහෝදර/ සහෝදරයින් විසින් ඔවුන් එකිනෙකාට විරුද්ධව ඉදිරිපත් කර ඇති පැමිණිලි වන නමුත් එම පැමිණිලිවලින් කිසිදු පැමිණිල්ලක පැමිණිලිකාරියට හෝ ඔහුගේ ස්වාමියාට එරෙහිව සිදුකරන ලද පැමිණිල්ලක් නොමැති බවයි.

පැමිණිලිකාරියගේ ස්වාමියා විසින් පැමිණිලි කිහිපයක් ඔහුගේ පවුලේ සාමාජිකයින්ට එරෙහිව සිදුකර ඇති අතර, ඒවා බරපතල සාමය කඩවීමකට අදාළ නොවන සුළු පැමිණිලි බව පෙනී යයි. එහෙත් පැමිණිලිකාරියට එරෙහිව කිසිදු පැමිණිල්ලක් පේරාදෙණිය පොලිස්ථානයට ඉදිරිපත් වී නොමැති අතර, ඇයව කැඳවා විභාගයක් සිදුකිරීමක් හෝ අවවාද කිරීමක් සිදුවී ඇති බව තහවුරු නොවේ. පොලිස්ථානය වෙත වාර්තා වී ඇති පැමිණිලි අනුව ඊට අදාළ පාර්ශවයන් වෙත අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 81 වන වගන්තිය අනුව නඩු පැවරීම සාධාරණ වුවද ඒ සඳහා කිසිදු පැමිණිල්ලක් නොමැති පැමිණිලිකාරියද ඇතුළත් කරමින් අදාළ නඩු පැවරීම පැමිණිලිකාරියට සිදුකළ බලවත් අගතියක් බව පෙනී යයි.

**නිගමනය :-**

පැමිණිලිකාරියට එරෙහිව කිසිදු පැමිණිල්ලක් නොතිබියදී 81 වන වගන්තිය යටතේ පැමිණිලිකාරියට එරෙහිව නඩුවක් පැවරීම මඟින් පැමිණිලිකාරියට 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට ඇති මුලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

ඒ අනුව, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවට අනාවරණය වී ඇති බැවින්, පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති එවකට පේරාදෙණිය පොලිස්ථානයේ ස්ථානාධිපතිව සිටි වර්තමාන සහකාර පොලිස් අධිකාරි චන්දන බස්නායක යන අයට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීම සඳහා පොලිස්පති විසින් පියවර ගත යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2023. 02.10 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

මා.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :-

01. අමාත්‍යතුමා
ආරක්ෂක අමාත්‍යාංශය,
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
14 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

02. පොලිස්පති,
පොලිස් මූලස්ථානය, කොළඹ 01.

03. මා.හි.කො.ස ප්‍රාදේශීය කාර්යාලය, මහනුවර.

B/